# පඨිත ඉංග්‍රීසි - සිංහල සිංහල - ඉංග්‍රීසි පාරිභාෂික පදමාලාව

සමාජීය විද්‍යා සහ
සංස්කෘතික අධ්‍යයන සඳහා

**පළමු සංස්කරණය**

සංස්කරණය සහ සම්පාදනය

සසංක පෙරේරා
හරින්ද්‍ර දසනායක

# පඨිත ඉංග්‍රීසි - සිංහල, සිංහල - ඉංග්‍රීසි පාරිභාෂික පදමාලාව

(සමාජීය විද්‍යා හා සංස්කෘතික අධ්‍යයන සඳහා)

පළමු සංස්කරණය

2006 Colombo.

සංස්කරණය හා සම්පාදනය

සසංක පෙරේරා

හරින්ද්‍ර දසනායක

සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ
කොළඹ ආයතනය

© පදමාලා සම්පාදනයක් වශයෙන් සියලුම හිමිකම් සමාජ සංස්කෘතික නිවුං අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය සතු වේ, 2006.

© සියලුම පදවල හිමිකම් භාෂක සමාජය සතුවේ, 2006.

ප්‍රකාශන හිමිකම පිළිබඳ ගෛතික කොන්දේසි අදහස් ගලනයට හා සම්භාෂණයට බාධා පැණවිය හැකි නිසා ප්‍රකාශන අයිතිය පිළිබඳ මතවාදී විශ්වාසයක් සමාජ සංස්කෘතික නිවුං අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය තුළ නොමැත. එබැවින් මෙහි අන්තර්ගතය සංවාද හා බුද්ධිමය කටයුතු සඳහා ඕනෑම ආකාරයකින් යොදා ගැනිමට අවසර තිබේ.

ISBN 955-1493-00-1

ප්‍රකාශය:

සමාජ සංස්කෘතික නිවුං අධ්‍යයනය සඳහා වූ
කොළඹ ආයතනය, 119A, කින්සි පාර, කොළඹ 8.

මූල්‍ය සම-දායකත්වය: හිර්ට ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව.

# පටුන


| | |
|---|---|
| පෙරවදන | v |
| හැඳින්වීම | vii |
| ඉංග්‍රීසි - සිංහල පාරිභාෂික පදමාලාව | 1 |
| සිංහල - ඉංග්‍රීසි පාරිභාෂික පදමාලාව | 55 |
| ආශ්‍රේය හා අමතර පඨිත | 109 |

# පෙරවදන

පර්ශීන පාරිභාෂික පදමාලාව (පළමු සංස්කරණය) සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය විසින් සැලසුම් කරන ලද පාරිභාෂික පද සම්පාදන ව්‍යායාමයේ මූලික පියවර වේ. එය ඉදිරියේදී කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන, පුළුල් හා වඩාත් සංවිධිත කිරීමට අපේක්ෂිතය. එනිසාම එය අප දකින්නේ කෙටි කාලීන හා ඌනපූරණ ව්‍යායාමයක් ලෙසිනි. මෙ ව්‍යායාමය මූලිකවම ස්වේච්ඡා ව්‍යායාමයක් වන අතර, ඊට භාෂා උපදේශන කණ්ඩායමක මෙන්ම තාක්ෂණික කණ්ඩායමක සහාය ද ලැබුණි. භාෂා උපදේශන කණ්ඩායමට පහත සඳහන් අය ඇතුළත් වූහ:

- ආනන්ද තිස්ස කුමාර (සිංහල, සංස්කෘත, පාලි, ප්‍රාකෘත)
- නලින් ස්වාරිස් (ලතින්, ඕලන්ද, ඉංග්‍රීසි)
- අශෝක ද සොයිසා (ජර්මන්)
- හරින්ද්‍ර දසනායක (සිංහල, ප්‍රංශ, ජර්මන්)
- ටී. ශනාතනන් (දෙමළ)
- සසංක පෙරේරා (ඉංග්‍රීසි)

සංස්කාරකවරුන් දෙදෙනාට අමතරව, තාක්ෂණික කණ්ඩායමට පහත සඳහන් අය ද ඇතුළත් වූහ:

- චන්ද්‍ර ලේකම්ආරච්චි (අක්ෂර සංයෝජනය)
- ජනානන්ද ලක්සිරි (පිටු සැකැස්ම, ග්‍රැෆික් සැලසුම්කරණය, මුද්‍රණ සම්බන්ධීකරණය)

වසර 2005 දී සම්පාදන කටයුතු ඇරඹි මුල් කාලයේදී පඨිත පළමු වෙළුමේ යොදාගත් කේන්ද්‍රීය වචන හා සංකල්ප පිටපත්කර ගැනීමේදී ක්‍රිෂාන්ත ෆෙඩ්රික්ස්ගේ සහාය ද මෙ ව්‍යායාමයට ලැබුණි.

තවද, සඳහන් කළ යුතු කරුණක් වන්නේ මෙ වෙළුමේ ඉංග්‍රීසි - සිංහල හා සිංහල - ඉංග්‍රීසි පාරිභාෂික පදමාලා පිළිවෙලින් ඉංග්‍රීසි හා සිංහල අකාරාදි පිළිවෙළට සැකසීමට උත්සාහ ගත් බවය. මෙ ක්‍රියාවලියේදී සැපයූ උපකාර සම්බන්ධයෙන් අනෝලි පෙරේරා, ප්‍රියන්ත ෆොන්සේකා හා ජයන්ති තෙන්නකෝන්ට කොළඹ ආයතනයේ ස්තුතිය හිමි වේ.

මෙසේ සිංහල අක්ෂරානුළිවෙලට සැකසීමේදී යොදා ගනු ලැබුවේ පහත සඳහන් අකාරාදිය බැව් සැළකුව මනාය:

අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ, එ, ඒ, ඓ, ඔ,
ඕ, ඖ, අං, අඃ, ක, ඛ, ග, ඝ, ඞ, ඟ, ච, ජ, ඣ, ඤ, ඥ,
ට, ඨ, ඩ, ඪ, ණ, ඬ, ත, ථ, ද, ධ, න, ඳ, ප, ඵ, බ, භ,
ම, ඹ, ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ.

මීට අමතරව, අදාල අවස්ථාවල එක් එක් අක්ෂරයේ විකාශන අනුපිළිවෙල 'ක'අක්ෂරය ආශ්‍රයෙන් පහත සඳහන් කර ඇති ආකාරයට සිදු කර ඇති බැව් සැළකුව මනාය:

ක, කා, කැ, කෑ, කි, කී, කු, කූ, කෘ, කෲ, කෙ, කේ,
කෛ, කො, කෝ, කෞ, ක්, කෟ, ක්‍ර, ක්‍රා, ක්‍රි, ක්‍රී, ක්‍රැ,
ක්‍රෑ, ක්‍රෙ, ක්‍රේ, ක්‍රෛ, ක්‍රො, ක්‍රෝ, ක්‍රෞ.

මෙහිදී සඳහන් කළයුතු කරුණක් වන්නේ සිංහලයේ ඇතැම් පදවල අක්ෂර වින්‍යාසය පිළිබඳව සම්මුතියක් නොමැති බවත්, එම විසම්මුතිය සාධාරණීකරණය සඳහා ගතික කතිකාවක්ද නොමැති බවය. එම නිසා මෙවන් පද සඳහා අපගේ වරණය යොදා ඇත. සංස්කරණයේ පහසුව තකා, ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් අපගේ වරණය වූයේ ඇමරිකානු අක්ෂර වින්‍යාසයයි.

අවසන් වශයෙන්, සිංහල භාෂා සංස්කරණය අධීක්ෂණය කළ ආනන්ද තිස්ස කුමාරට ද මූලික පිටු සැකැස්ම හා කංචුකය නිර්මාණය කළ අනෝලි පෙරේරාට ද මුද්‍රණ කටයුතු සඳහා මූල්‍ය සහයෝගයක් ලබා දුන් හිර්ෆ් ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුවට ද මේ පාරිභාෂික පද මාලාව සැකසීමේදී නන් අයුරින් සහාය දුන් අන් සැමට ද සංස්කාරකවරුන්ගේ හා කොළඹ ආයතනයේ ස්තූතිය හිමි වේ.

සසංක පෙරේරා
හරින්ද්‍ර දසනායක

සම්පාදකවරු හා සංස්කාරකවරු,
සමාජ සංස්කෘතික තිව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය,
119 A, කින්සි පාර,
කොළඹ 8.

30 ජුනි 2006

# හැඳින්වීම

පඨිත පාරිභාෂික පදමාලාව එළිදකින්නේ සමාජ සංස්කෘතික තිව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය පසුගිය වසර තුනක පමණ කාලය තුළ නියැළී සිටි බුද්ධිමය ක්‍රියාකාරකම්වල අතුරු ඵලයක් වශයෙනි. මුලින්ම, පඨිත පාරිභාෂික අඩවිය යන පුළුල් තේමාව යටතේ පඨිත ලිපි සංග්‍රහයේ දෙවන වෙළුමේ (2003) අවසන් කොටස තුළින් අපි එතෙක් පඨිත පළමු හා දෙවන වෙළුම්වලින් සාකච්ඡාවට භාජනය වූ විෂය සම්බන්ධයෙන් භාවිතයට ගැනුණු පද හා එම විෂයන් සම්බන්ධ ඇතැම් අමතර පද ද කැටිකොට ගත්, සාපේක්ෂ වශයෙන් අසම්පූර්ණ පාරිභාෂික පදමාලාවක් ඉදිරිපත් කෙළෙමු (පඨිත 2003). මෙවැනිම පාරිභාෂික පදමාලාවක් පඨිත තෙවැනි වෙළුමෙන් ද එකී වෙළුමේ සාකච්ඡාවට බඳුන් වූ විෂයයන්ට සාපේක්ෂව ඉදිරිපත් කෙළෙමු. මෙවැනි අංගයක් පඨිත හෝ ජාත්‍යන්තරව පළවෙන එවැනි අන් විමර්ශිත ලිපි සංග්‍රහ තුළ සාමාන්‍යයෙන් දකගත නොහැකි අංගයකි. පඨිත මුලින්ම සැලසුම් කළ අවධියේදී මෙවන් අංගයක් ඇතුළු කිරීමට අප තුළ බලාපොරොත්තුවක් තිබුණේ ද නැත (පඨිත 2003). එසේ වුවද, මේ මැදිහත්වීම කිරීමට අප තීරණය කෙළේ පඨිත පළමු වෙළුම කියැවූ ශාස්ත්‍රඥයන් හා සාමාන්‍ය පාඨකයන් බොහෝ දෙනෙකු ද අපගෙන් කළ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙනි. එනම්, ඔවුන්ගේ අදහස වූයේ එකී වෙළුමෙන් සාකච්ඡාවට භාජනය වූ ඇතැම් ලිපි වරහන් තුළ වූ බොහෝ වචනවල ඉංග්‍රීසි අරුත් මෙන්ම ඇතැම් සංකල්ප හෝ වචන අප යොදා තිබුණේ කුමන අර්ථයකින්ද යන්න පැහැදිලි නොවීම කියවීම අපහසු කෙළේය යන්නය. මේ අනුව, සංස්කාරක මණ්ඩලය ගනු ලැබූ තීරණයකට

අනුව, අවම වශයෙන් කෙටිකාලීනව හෝ එක් එක් වෙළුමෙන් සාකච්ඡා වූ විෂයන්ට සාපේක්ෂව වෙනම පාරිභාෂික පදමාලාවක් සෑම පඨිත වෙළුමකටම ඇතුළත් කරන ලදී. 2003 වසරේදී සංස්කාරක මණ්ඩලය ගත් තවත් තීරණයක් වූයේ ඉදිරියේදී මෙකී පද හා අමතර පද ද ඇතුළත් වන පරිදි කොළඹ ආයතනයේ බුද්ධිමය හා පර්යේෂණ දිශානති ද නියෝජනය වන ආකාරයේ පාරිභාෂික පදමාලාවක් වඩාත් පුළුල්ව විසරණය කිරීමේ අටියෙන් සම්පාදනය කළ යුතු බවය. මේ පාරිභාෂික පද මාලාවේ ප්‍රභවය සිදුවූයේ ඒ අයුරිනි.

මෙහි ඇති ඇතැම් පද ඒවා අපගේ මෑතකාලීන බුද්ධිමය කටයුතුවලදී යොදා ගත් ආකාරයට හා මෙහිදී දැන් ඉදිරිපත් කර ඇති සන්දර්භයානුකූලවම, එම අර්ථ ස්වරූපවලින්ම වෙනත් බුද්ධි සම්පාදන අවකාශ තුළ දැනටමත් භාවිතයට ගෙන ඇත (පඨිත 2003). එනිසා ඒවා පිළිබඳ යම් ප්‍රමිතියක් සහ එකඟතාවක් මේ වන විට ඇති වී තිබේ (පඨිත 2003). එමෙන්ම, අන් පද අප පසුගිය කෙටි කාලය තුළ යොදා ඇත්තේ ද, මෙහිදී ඉදිරිපත් කරනුයේ ද ඒවා සාමාන්‍යයෙන් යෙදෙන සන්දර්භයෙන් වෙන්කොට වෙනත් සන්දර්භයක වන අතර, ඒ ක්‍රියාවලිය හේතුවෙන් එකී නව සන්දර්භ තුළ ඒවායේ අරුත් ද වෙනස් වී ඇත (පඨිත 2003). මීට අමතරව, අප යොදා ඇති අන් පද දැනට නොයෙක් සන්දර්භ තුළ භාවිතයේ පවතින පද එකතු කිරීමෙන් හෝ අන් භාෂා උපක්‍රම මඟින් අප සම්පාදනය කළ ඒවාය (පඨිත 2003). එමෙන්ම ඇතැම් පද යොදා ඇත්තේ එකිනෙකට වෙනස් අර්ථ කිහිපයක් සඳහා එක් පදයක් වශයෙනි. මේ අවසානට සඳහන් කළ තත්ත්වය යම් බුද්ධිමය ව්‍යාකූලත්වයකට තුඩු දිය හැකි බැවින් අප එය දකින්නේ හුදු කෙටි කාලීන උපක්‍රමයක් වශයෙන් පමණක් වන අතර,

අනාගතයේදී එකී තත්ත්වය විසඳා ගැනීමට වෙර දැරිය යුතු බව පැහැදිලිය.

සිංහල භාෂාවෙන් විධිමත් ශාස්ත්‍රීය රචනාකරණයේ යෙදෙන විට අප මුහුණපාන ප්‍රධානතම ගැටලුවක් නම් සංකීර්ණ අදහස් හෝ සංකල්ප විස්තර කිරීමට හෝ සන්දර්භගත කිරීමට අනාවශ්‍ය වියුක්ත තාක්‍ෂණික පද මාලාවක සාපේක්‍ෂ අඩුවය. වාස්තු විද්‍යාව, සංස්කෘතික අධ්‍යයන හා එවැනි ඇතැම් ක්‍ෂේත්‍ර සම්බන්ධයෙන් නම්, මෙකී අඩුව සැබැවින්ම බොහෙවින් පරිපූර්ණ නොමැතියාවක් සනිටුහන් කරයි. මේ නිෂේධක තත්ත්වයට පදනම සපයන ප්‍රධාන හේතු ගණනාවක් හඳුනාගත හැකිය. මේවා නම්, අපගේ දැනුම් සම්පාදන අඩවි තුළ, විශේෂයෙන්ම සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර  ලෙස සැලකෙන ශාස්ත්‍රාලයීය ක්‍ෂේත්‍ර තුළ ඇති බුද්ධිමය මන්දගාමී භාවය, නිරන්තර හා ගැඹුරු අර්ථ විවරණයේ හා රචනාකරණයේ ඇති අඩුව සහ න්‍යාය සම්පාදනයට හා භාවිතයට ඇති ආයතනික හා පෞද්ගලික අකමැත්ත යන කරුණුය. අනෙක් අතට, සිංහල භාෂාව සමග සමීප ඥාති සබඳතා පවත්වන සංස්කෘත, පාලි හා දමිළ යන භාෂා මෙන්ම, එවැනි ව්‍යුහාත්මක සබඳතා නොමැති, එහමුත් අනේක බලපෑම් කලින් කලට ලබා දෙන ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන් වැනි තත්කාලීන යුරෝපීය භාෂා හා පැරණි ලතින් හා ග්‍රීක වැනි භාෂා ද බෙන්ගාලි හා හින්දි වැනි තත්කාලීන කලාපීය භාෂා ද පාරිභාෂික පද හා සංකල්ප ගවේෂණ ක්‍රියාවලියේදී අනේක හා මහඟු මූලාශ්‍ර සපයයි.  මේ සියල්ල මූලාශ්‍ර ප්‍රභව සේ අප සැලකුව ද ඓතිහාසික, ව්‍යුහාත්මක, උපයෝගීතාමය හා චිත්තවේගීය හේතු මත අප වඩාත් යොමුවූයේ සංස්කෘත හා පාලි මූලාශ්‍රය වෙතය.

ඉහතින් දක්වූ සීමාකාරී තත්ත්ව තුළ දැනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් කිහිප දෙනෙකු හා ආයතන කිහිපයක් විසින් වරින් වර ප්‍රකාශයට පත් කර ඇති පාරිභාෂික ශබ්දමාලා හා ශබ්දකෝෂ කොතරම් ප්‍රයෝජනවත් වුවද, ඒවා යම් සීමාවන්ගෙන් ඔබ්බට යන්නේ නැත (පයීත 2003). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් සම්පාදිත පුරෝගාමී පාරිභාෂික ශබ්දමාලා මගින් වඩාත් පෝෂිත පරිවර්තන සම්ප්‍රදායක බිහිවීම මත හෙළූ ආලෝක ධාරා, එම පදමාලා නොකඩවා පළ නොවීමේ හා නිසි පරිදි යාවත්කාලීන නොවීමේ දෝෂයෙන් සාධනීය බලාපොරොත්තු ද සමග වියැකී ගොස් ඇති සැටියකි. මේ අඩුව නැතිනම් භාෂාමය දරිද්‍රතාව වඩාත් පැහැදිලි වන්නේ මෑතකාලීන දැනුම් සම්පාදන ක්ෂේත්‍ර හා අවශ්‍යතා සම්බන්ධයෙනි. උදාහරණයක් වශයෙන්, ව්‍යුහවාදී, පශ්චාත් ව්‍යුහවාදී, පශ්චාත් නූතනවාදී හා සංස්කෘතික අධ්‍යයන හා සම්බන්ධ අදහස් හා සංකල්ප වැනි දෑ පිළිබඳව කථා කිරීමේ දී මේ ගැටලුව වඩාත් බරපතළ ලෙස මතුවේ (පයීත 2003). එනමුත් භාෂාවේ ඇති අව-වර්ධනය නිසා පුළුල් වශයෙන් විධිමත් බුද්ධිමය සම්භාෂණයේ යෙදීමෙන් හා සුවිශේෂී වශයෙන් රචනාකරණයෙන් ඈත් වීම කළ යුතු හෝ කළ හැකි දෙයක් නොවේ (පයීත 2003). පයීත පාරිභාෂික පදමාලාව අප ඉදිරිපත් කරනුයේ මෙවැනි සන්දර්භයක් තුළය. තවද, මේ ව්‍යායාමය අප දකින්නේ තනි ආයතනික ව්‍යාපෘතියක් වශයෙන් නොවේ. මෙය නුදෙක් වෙනත් බොහෝ ආයතන හා පුද්ගලයන් පෙර හා බොහෝ කාලයක පටන් ගමන් ගත් මගක එක් කෙටි ඉදිරි පියවරක් පමණි. තවද, අප මේ ව්‍යාපෘතිය නිර්වචනය කරන්නේ අනේක පාඨාන්තරීය පාඨනවල එක් ප්‍රතිඵලයක් වශයෙනි. මේ පාඨාන්තරීය

පාඨන පදනම් වූ දැනට ප්‍රකාශයට පත් වී ඇති පයිීන මේ ව්‍යාපෘතියට මහඟු ආලෝකයක් සැපයූ බව පැහැදිලිවම ප්‍රකාශ කළ යුතු අතර, ඒ සියල්ල මේ පාරිභාෂික පද මාලාවේ ආශ්‍රය හා අමතර පයිීන අනරට එක් කර ඇත. තව දුරටත් පැහැදිලි කරන්නේ නම්, වචන හෝ සංකල්ප තනි පුද්ගලයන්ගේ හෝ කණ්ඩායම්වල පෞද්ගලික අයිතිය යටතේ පවතින දේ ලෙස අප සලකන්නේ නැත. ඒවායේ ප්‍රභවය කුමක් වුව ද ඒවා මුලින්ම සංකල්පනය කෙළේ කවුරුන් වුව ද අදාළ සංස්කෘතියට ප්‍රයෝජනයක් තිබෙන තාක් කල් ඒවා සැබැවින්ම සමස්ත සංස්කෘතියේම පොදු දේපොළ සේ සැලකුව මනාය.

මේ පාරිභාෂික පද මාලාව පළ කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ හුදෙක් පයිීන වෙළුම් තුළ දැනට පළවී ඇති හා ඉදිරියේදී පළවීමට නියමිත ලිපි කියවීම වඩාත් පහසු කිරීම හෝ අපගේ බුද්ධිමය අණසක සියලු දෙනා මත පැටවීම හෝ නොවේ. මෙය ඉදිරිපත් කරනුයේ කතිකාමය ප්‍රවේශයක් වශයෙනි. නැතහොත්, බුද්ධිමය සම්භාෂණයකට මුලපිරීමක් වශයෙනි. මේ පද ඒවායේ සුදුසුකම, ප්‍රයෝජනය, ඥාන විභාගාත්මක ගෝචරබව ආදි කරුණු මත යම් ආකාරයක බුද්ධි කලම්බනයකට භාජනය කිරීමෙන් යම් ආකාරයක ප්‍රමිතියකට ඒවා කාලාවකාශානුකූලව පත් කළ හැකිය (පයිීන 2003). එතුළින්, අවශ්‍ය නම් හා ප්‍රයෝජනවත් නම්, වෙනත් ලේඛකයන්ට ද මේ පද යොදාගත හැකිය. නොඑසේ නම්, ඒවා යම් ආකාරයෙන් වෙනස් කොට, වඩාත් සුදුසු ස්වභාව හෝ යෙදුම් ප්‍රගුණ කර ගත හැකිය (පයිීන 2003). එසේත් නැතිනම්, ඒවා මුළුමනින්ම ඉවත දමා, ඒ වෙනුවට වෙනත් පද යෝජනා කළ හැකිය. එහෙත් මෙය

මූලික වශයෙන් චිත්තවේගීය අගතීන්ගේ ග්‍රහණයට හෝ භාෂා පාරිශුද්ධවාදීන්ගේ සහ භාෂා සංහාරකයන්ගේ න්‍යායපත්‍රවලට ලඝු නොවූ විධිමත් ශාස්ත්‍රීය හා බුද්ධිමය ව්‍යාපෘතියක් පමණක් විය යුතුය (පයීත 2003).

අපගේ බලාපොරොත්තුව මේ කර්තව්‍යයට කෙටි කාලීන හා මූලික අවකාශයක් සහ ප්‍රවේශයක් සැපයීමය. මේ සම්බන්ධව වඩාත් දීර්ඝකාලීන, පරිපූර්ණ හා තිරසාර මැදිහත්වීම් කොළඹ ආයතනයේ ඉදිරි ක්‍රියාකාරකම් තුළින් හා අනාගත පයීත වෙළුම් තුළින් ඉදිරියට ගෙන යාමට අපි බලාපොරොත්තු වන්නෙමු. එලෙසම බුද්ධිමය දැනුම් සම්පාදනය සම්බන්ධයෙන් උනන්දුවක් ඇති අන් කණ්ඩායම් හා පුද්ගලයන් ද මේ කටයුත්තට ඉදිරියේදී දායක වනු ඇතැයි අපි උදක්ම බලාපොරොත්තු වන්නෙමු. මේ පාරිභාෂික පදමාලාව අවශ්‍ය පරිදි වරින් වර නව සංස්කරණ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට ද කොළඹ ආයතනය බලාපොරොත්තු වේ.

සසංක පෙරේරා

හරින්ද්‍ර දසනායක

සම්පාදකවරු හා සංස්කාරකවරු

# ඉංග්‍රීසි - සිංහල පදමාලාව

## A

abbreviation - සංක්ෂේපණය, සංක්ෂිප්තය

abolitionist - උත්සාධනවාදියා

absence - නොමැතියාව

absolute meaning - පරම-අර්ථය

absolutism - පරමාර්ථවාදය, නිරපේක්ෂතාවාදය

abstract art - වියුක්ත කලාව

abstract theory - වියුක්ත න්‍යාය

academia - ශාස්ත්‍රාලය, ශාස්ත්‍රාලයීය පද්ධතිය

academic dynamics - ශාස්ත්‍රීය ගතික

acceleration - ත්වරණය

accommodation - අනුකූලනය, අනෙකාට අවකාශ සැපයීම

accord - සම්මුතිය, ඒකමතිය

achronic - නිර්කාල

achronicity - නිර්කාල ක්‍රමය

acquired - උපාර්ජනය කරන ලද, උපාර්පිත, උපාර්ජන, අත්පත් කරගත්

activism - ක්‍රියාවාදය

actual text - තථ්‍ය පඨිතය

adjective - විශේෂණය

adopt - ප්‍රතිග්‍රහණය

adultery - අනාචාරය (පරදාර සේවනය හෝ පරපුරුෂ සේවනය)

advanced study - නිම්න අධ්‍යයනය

aesthetic pleasure - සෞන්දර්ය ප්‍රබෝධය, සෞන්දර්ය සුඛය

aesthetics - සෞන්දර්යය / සෞන්දර්යවේදය

affine - විවාහ ඥාතියා

affinity - සබඳතාව, බන්ධුත්වය

agency - කාරකත්වය

alienation - පරාරෝපණය

allegory - අන්‍යාලාපය, දෘෂ්ටාන්තය

alliteration - අනුප්‍රාසය

allusion - ව්‍යංගය

altruism - පරහිතකාමිත්වය

ambiguity - සන්දිග්ධතාව, ද්වර්ථතාව

ambiguous - සන්දිග්ධ

ambivalent - උභයාර්ථිත

amnesia, forgetting - විස්මෘතිය, අමතකවීම

amorphous - නිශ්චිත හැඩයක් නැති, අනියතාකාර

amphilingual - උභයභාෂික

anachronism - කාල ව්‍යති ක්‍රමය

analogy - සාදෘශ්‍යය

analytic philosophy - විශ්ලේෂීය දර්ශනය

anarchism in politics - දේශපාලනයේ අරාජිකවාදය

androgynous - පුංජායාංගික

androgyny - අවිලිංගිකතාව, ෂණ්ඩතාව

anecdote - ලුහු අන්දරය, උපාඛ්‍යානය

animatism - සර්වාත්මවාදය

animism - ප්‍රාණවාදය

anomaly - අස්වාභාවික / අයථා

anonymous - අඥාත

antagonism - පසමිතුරුකම, එදිරිවාදිකම්

antagonistic poles - පසමිතුරු ධ්‍රැව

anthropological basis - මානව විද්‍යාත්මක පදනම

anthropomorphic - මනුෂ්‍යත්වාරෝපිත, මානවත්වාරෝපිත

anthropophagy - මනුෂ්‍ය මාංස භක්ෂණය, මනුෂ්‍ය භක්ෂණය, මිනීමස් කෑම

anti-empirical position - අනුභූති විරෝධී ස්ථාවරය

anti-realist - යථාර්ථ විරෝධී

anti-thesis - ප්‍රතිවාදය

anti-art - ප්‍රති-කලාව

anticipation - පූර්වාපේක්ෂණය

anti-intellectual - බුද්ධි-විරෝධී

antiquity - පෞරාණිකත්වය

anti-social - සමාජ විරෝධී

anxiety - කාංසාව

apartheid - වර්ණභේදය

aphrodisiac - රති ප්‍රබෝධකය, කාමෝද්දීපකය

apocalyptic pronouncement - කල්පාන්ත ප්‍රකාශනය

aporias - සීමා සංශය

apotheosis - දේවත්ව පූර්ණය, දේවත්වාරෝපණය

appearance / appearances - දෘශ්‍යමානය / දෘශ්‍යමාන

applied research - ව්‍යවහාරික පර්යේෂණ

appropriation - අනුයෝජනය, අත්පත් කරගැනීම

arbiter of meaning - අර්ථයේ අවසාන විනිශ්චයකරුවා, අර්ථ තීරක

arbitrary - අත්තනෝමතික, අභිමතාර්ථානුකූල, අර්පිතාර්ථිත

archaeology of knowledge - දැනුමේ පුරාවිද්‍යාව

archetype - මූලාකෘතිය

aristocracy - රදල තන්ත්‍රය

arrivist - ස්ථාවරය අපැහැදිලි

art buyer - කලා (කෘති) ගැනුම්කරුවා

art collector - කලාකෘති එකතුකරන්නා

art history - කලා ඉතිහාසය

art lover - කලා ප්‍රේමියා

artistry - කලාශිල්ප

asexual - අලිංගික

assimilation - සමාග්‍රහණය

association - සංගමනය, අභිසංගමය, සංඝටනය

assumption - උපකල්පනය

atemporal - අකාලික

atheism - අදේවවාදය

athleticism - ජවනවාදය, ක්‍රීඩා උන්මාදය

atoll - අතොල

attraction - ආකර්ෂණය

audacious courage - ප්‍රගල්භ නිර්භීතකම

aura - තේජෝ මණ්ඩලය

Australasia (Australia + Asia) - ඔස්ට්‍රලේසියානු

authentic culture - අව්‍යාජ සංස්කෘතිය

authentic version - සැබෑ පිටපත, නිවැරදි පිටපත

authenticity - අව්‍යාජත්වය, නිර්ව්‍යාජත්වය

author - කර්තෘ

authoritative - ආධිපත්‍යධාරී

authority - අධිකාරිත්වය

authorized - අවසරලත්, වරලත්

autonomous text - ස්වතන්ත්‍ර පඨිතය, ස්වාධීන පඨිතය

axiom - ස්වසිද්ධිය, ප්‍රත්‍යක්‍ෂය

axis - අක්‍ෂය

# B

base structure - පාදක ව්‍යූහය

bazzar art / calendar art - බජාර් කලා, වෙළෙඳපොළ කලා / දින දර්ශන කලා

beauty - අලංකාරය, චමත්කාරය, ලස්සන, රූපලාවණ්‍යය

bilingual - ද්විභාෂික

binary opposites - ද්විත්ව ප්‍රතිපක්‍ෂ

bio-culture - ජෛව සංස්කෘතිය

bioethics - ජෛව ආචාර ධර්ම, ජෛව ආචාර විද්‍යාව

biography - චරිතාපදානය

biosphere - ජෛවගෝලය

bi-polar - ද්වි-ධ්‍රැව

blasphemy - සමයාපහාසය

bodily demeanor - ශාරීරික ලීලාව

bodily rigor - සක්‍රිය කායික ශක්තිය

bohemian - බොහිමියානු, සමාජ අසම්මත

border - මායිම, සීමාව

bound seriality - බැඳි අනුක්‍රමිකතාව

boundary - සීමාව

boundary keepers - මායිම් රකින්නෝ

bourgeois religion - ධනේශ්වර ආගම, බූර්ෂුවා ආගම

bourgeoisie - ධනේශ්වරය, බූර්ෂුවා පන්තිය

brand - සන්නාම, වෙළෙඳ ලකුණ

brash - සාටෝප

built space - ඉදිකළ අවකාශය

bureaucracy - නිලබල ක්‍රමය, නිල තන්ත්‍රය

# C

cannibal - පෝරිසාදයා

cannibal behavior - පෝරිසාද චර්යාව

cannibal feast - පෝරිසාද භෝජන සංග්‍රහය

cannibal talk - පෝරිසාද කථා

cannibalism - පෝරිසාද චර්යාව

cannibalistic - පෝරිසාද, පෝරිසාදීය

canonization - ශුද්ධවන්තකරණය, ශාන්තුකරණය

Cartesian analysis - කාටීසියානු විග්‍රහය

castration - අණ්ඩහරණය, කරඇඹීම

catharsis - භාව විශෝධනය

catholic - සර්ව සාධාරණ

Catholic - කතෝලික

celebrate - සැමරීම

census - සංගණනය

challenge - අභියෝගය

chastity - පතිවත, පතිව්‍රතාව, බඹසර, කන්‍යාභාවය

chorale - වෘන්දය
choreography - රංග වින්‍යාසය
chronology - කාලානුක්‍රමය
chronophonism - ඒක රේඛීය කාල ක්‍රමය
cinematization of space - අවකාශය සිනමාකරණය
circuit - පරිපථය
circumcision - චාක්‍රකෘන්තනය, චර්ම ඡේදනය
civilizing mission - ශිෂ්ටකරණ ව්‍යාපෘතිය
clandestine - රහස්‍ය
clichéd - අවචින්තිත
cliché - අවචින්තනය
closed - ආවෘත / සංවෘත
code - කේතය, ආකේතය
codes of masculinity - පුරුෂත්ව කේත
codification - කේතගත වීම, කේතගත කිරීම, ආකේතනය
coercion - බලකිරීම
cogito - මන්‍යාහම් අස්මි
cohabitation - සහවාසය
coherent - සංසක්ත
collective experience - පොදු අනුභූතිය
colonial agent - යටත්විජිත කාරකයා
colonial gaze - යටත්විජිත බැල්ම
colonial imagination - යටත්විජිත පරිකල්පනය
colonial subject - යටත්විජිත වැසියා / යටත් වැසියා / යටත්විජිත වස්තු විෂයය
colonialism - යටත්විජිතවාදය (විජිතවාදය)

colonialist - විජිතවාදියා

colonization - විජිතකරණය

colonizer - විජිත පිහිටුවන්නා

colony - ජනපදය / විජිතය, යටත්විජිතය

commemorate - අනුස්මරණය

commercialization - වාණිජකරණය

common sense - ව්‍යවහාරික බුද්ධිය, ව්‍යවහාර ඥානය

communism - කොමියුනිස්ට්වාදය

community - ප්‍රජාව

compact - සංයුක්ත

complete fake - පූර්ණ ව්‍යාජත්වය

complete reality - පූර්ණ යථාව

component - සංරචකය

composer - සංධ්වනි රචකයා

compromise - අවරෝහණීය සම්මුතිය

concept - සංකල්පය

conception - සංකල්පනය / පිළිසිඳීම

conceptual - සාංකල්පික, සංකල්පීය

conceptual form - සංකල්පීය ආකෘතිය

conceptualism - සංකල්පවාදය

conceptualization - සංකල්පකරණය

conclusion - නිගමනය

concomitance - සහභාවය

condition - කොන්දේසිය

conduit - ප්‍රණාලිය, නාඩිනිය

configuration - වින්‍යාසය

conflations - එක්තැන් කිරීම

conformism - අනුකූලවාදය, අනුසාරිකවාදය

conformist - අනුකූලවාදියා, අනුසාරිකවාදියා

congregation - සමූහය

connoisseur - රසඥයා

conscience - සවිඥානය, හෘද සාක්ෂ්‍ය

conscientious - අනලස්

consciousness - සවිඥානකතාව, සවිඥානකත්වය

consent - සහමතිය

conservative - ගතානුගතික

constitution - සංස්ථාපනය / ව්‍යවස්ථාව

construct - ගොඩනැගීම, නිර්මාණය

constructive - අභිසංස්කරණාත්මක, අස්තිත්වාත්මක, උත්පාදක, ආධාරක

constructivism - නිර්මාණවාදය

consumption - පරිභෝජනය

contemporary - සමකාලීන

contemporary relevance - සමකාලීන අදාළත්වය

context - සන්දර්භය

contingent - ආවස්ථික

continuity - සන්තතිය, අඛණ්ඩතාව, අවිච්ඡින්නතාව

copy of a dream - සිහිනයක පිටපත

coronation - ඔටුනු පැළඳවීම, රාජාභිෂේකය

corporeal - ශාරීරික

corporeal remains - භස්මාවශේෂ

correct demeanor - නිවැරදි හැසිරීම

cosmos - විශ්වය

counter enlightenment - ප්‍රතිප්‍රබුද්ධතාව

counter weight - ප්‍රතිතුලනය

counter-humanism - ප්‍රති-මානවවාදය

counter-memorializing analysis - ප්‍රති-ස්මෘතික විශ්ලේෂණය

crafts - අත්කම් (කලා)

cranioscopy - හිස්කබල්වේදය

creationist theology - නිර්මාණවාදී දේවධර්මය

creative expression - නිර්මාණාත්මක ප්‍රකාශනය

criminalization - සාපරාධීකරණය

criminalized - සාපරාධීකෘත

criterion - උපමානය, මිනුම් දණ්ඩ

critical discourses - විචාර පූර්වක කතිකා

critique of ideology - මතවාදයේ පරීක්ෂාව, මතවාදයේ විවේචනය

cross - අතික්‍රමණය

cubism - ඝනිකවාදය

cultic practices - ඇදහිලි කටයුතු

cultural & urban forms - සංස්කෘතික හා නාගරික ආකෘති

cultural conditions - සංස්කෘතික කොන්දේසි

cultural consciousness - සංස්කෘතික සවිඥානකත්වය

cultural reading - සංස්කෘතික පාඨනය

cultural re-producers - සංස්කෘතික ප්‍රති-නිෂ්පාදකයෝ

cultural residues - සංස්කෘතික අවශේෂ

cultural studies - සංස්කෘතික අධ්‍යයන

cultural survival - සංස්කෘතික උත්ජීවනය

cultural zone - සංස්කෘතික කලාපය

culture - සංස්කෘතිය

# D

damnation - ගර්හාව, නාශනය

decadence - පරිහානිය

decentre - විකේන්ද්‍රණය

deconstruction - ව්‍යූහ විභාගය, ව්‍යූහ විභාගනය

decorative art - අලංකරණීය කලාව

de-culturation - අප-සංස්කෘතිකකරණය

dedicated - කැපකළ / සමර්පිත

deductive method - නිගාමී ක්‍රමය

definition - නිර්වචනය

deflation - අවධමනය

deformity - විරූපතාව

degenerate(d) - පිරිහුණු / භ්‍රෂ්ටයා

deification - දේවත්වාරෝපණය

déjà vu - දැනටමත් දුටු ඇති බව, දුටුවිරූ මායාව

delirium - විභ්‍රමණය, විභ්‍රාන්තිය

democracy - ප්‍රජාතන්ත්‍රවාදය

demon - දුෂ්ටාත්මය, භූතයා, යක්ෂයා

demon mania - භූතෝන්මාදය

demonolatry - භූත වන්දනය

denomination - නිකාය / නාමිකය

derivative - ව්‍යුත්පන්නය

desecration of graves - සොහොන් බිඳීම, සොහොන් කොල්ලය

destabilize - අස්ථායීකරණය

determinism - නියතිවාදය

deterrence - නිවර්තනය

deterrent - නිවර්තකය

dialectical synthesis - ද්වන්ධාත්මක සංකලනය

dialogue - සංවාදය

diaspora - විසිරී ගිය ප්‍රජාව, විසිරුණු ප්‍රජාව

dichotomy - ද්විධාකරණය, දෙබෙදුම

dictum - ප්‍රෝක්තිය, වාචිතය

didactic - උපදේශාත්මක

difference - අර්ථස්ථාපන වෙනස (පශ්චාත් නූතනවාදී අර්ථයෙන්)

difference - අසාම්‍ය, විභේදය, වෙනස (සාමාන්‍ය අර්ථයෙන්)

differend - භාෂාර්ථ අර්බුදය

direction - දිශාව

dirty war - ජරා යුද්ධය

disciplined bodies - ශික්ෂිත සිරුරු

discontinuity - අසන්තතිය

discourse - කතිකාව

discover - නිරාවරණය, සොයා ගැනීම

discrimination - විචයනය, පරිහාරය

discriminatory - පරිහාරීය

discursive - කතිකාමය

discursive formation - කතිකාමය නිර්මාණය

discursive practice - කතිකාමය භාවිතය

discursive spaces - කතිකාමය අවකාශ, විවාදකාරී අවකාශ

dissection - විච්ඡේදනය

dissent - විසම්මුතිය

dissonance - විස්වනය

distinctive - විශිෂ්ට

distinguish - විශද කරනවා

diversity - විභේදය, විවිධත්වය

docile bodies - බලරහිත සිරුරු

dogmatic - ආධානග්‍රාහි

domestic - ගෘහස්ථ

dominance - ආධිපත්‍යය

dominant - අධිපති

doomsday - කල්ප විනාශය

dynamics - ගතික

# E

ecclesiastical year - සමයානුකූල වර්ෂය

ecology - පරිසර විද්‍යාව

ecosystem - පරිසර පද්ධතිය

effect - ආචරණය

effemination - ආකාන්තායනය

effete - බෙලහීන

efficiency - කාර්යක්ෂමතාව

egalitarianism - සමානාත්මතාවාදය

ego - අහම, ස්වීයත්වය, ඊගෝ

egoism - අහංතාව, මමත්වය

elaboration - විස්තාරණය

Electra complex - ඉලෙක්ට්‍රා සංකීර්ණය

elegance - චාරුත්වය

element - මූල ධාතුව / මූලද්‍රව්‍යය / මුඛ්‍යාංගය

elimination - මූලෝත්පාටනය

emancipation - විමුක්තිය, මිදීම, නිදහස්වීම

embargo - නෞරෝධනය, තහනම

emblem - ලාංඡනය

embodiment - ප්‍රතිමූර්තිය

emic - ආභ්‍යන්තරික දෘෂ්ටිය

emigration - විගමනය

emotional biases - චිත්තවේගීය අගති

emphasis - අවධාරණය

empirical - ආනුභවික

enacting - රඟ දැක්වීම

enchant - වශීකිරීම

enclave - පරිවෘත්තිය

encounter - සමාසදය, මුණ ගැසීම

enculturation - අනුසංස්කෘතායනය

endo-cannibalism - අන්තර් පෝරිසාද චර්යාව

endogamous - අන්තර්ජන්‍යය

enhanced / advanced - තීව්‍ර

enjoyment - සුඛාස්වාදනය, ආනන්දනය

enlightened despotism - ප්‍රබුද්ධ ඒකාධිපතිත්වය

enlightenment intellectual tradition - පුනරුදවාදී චින්තන සම්ප්‍රදාය

enterprising - ව්‍යවසායශීලී

entity - වස්තුව

enumeration - සංඛ්‍යාකරණය

ephemeral - එසැණ නැසෙන

epic - වීරකාව්‍ය, වීරකතාව

epicenter - අපිකේන්ද්‍රය

epigraphy - අභිලේඛනය

episode - කථාංගය

episteme - ඥාන මීමංසාව

epistemic break - ඥාන විභාග ඛණ්ඩනය

epistemic violence - ඥාන විභාගාත්මක ප්‍රචණ්ඩත්වය

epistemology - ඥාන විභාගය

equality, liberty and fraternity - සමානතාව, නිදහස හා සහෝදරත්වය

equilibrium - සමතුලිතතාව

equity - සමසාධාරණත්වය

eradication - සමූලෝත්පාටනය

eschatology - භාවාන්තවේදය

essential - සාරාත්ම

essentialism - සාරාත්මවාදය, ආවශ්‍යකවාදය

ethics - ආචාර ධර්ම, සාරධර්ම, ආචාර විද්‍යාව

ethnic - ජනවාර්ගික

ethnic cleansing - ජනවාර්ගික පාරිශුද්ධකරණය

ethnic enclave - ජනවාර්ගික පරිවෘත්තිය

ethnicity - ජනවාර්ගිකත්වය

ethnicization - ජනවාර්ගීකරණය

ethno linguistic - ජනවාර්ගික භාෂාමය

ethnocentrism - මානවවංශ කේන්ද්‍රණය

ethnography - මානව වංශ ලේඛනය / මානව වංශ ලේඛනකරණය

ethnology - මානව වංශ විද්‍යාව

ethnomethodology - මානවවංශ ක්‍රමවේදය

ethno-psychology - මානවවංශ මනෝ විද්‍යාව

ethno-racial - ජනවාර්ගික-වාර්ගික

ethos - ඌරුව

etic - බාහිර දෘෂ්ටිය

etymology - නිරුක්තිය, නිරුක්තිවේදය

Eucharist - සත්ප්‍රසාදය

euro-centricity - යුරෝ-කේන්ද්‍රියත්වය

euthanasia - සුඛ මරණය, ස්වයං වරණ සහන ඝාතනය

evangelical - සුබස්නයනිය, ඉවැන්ජෙලිකල්

evil - දුෂ්ට, පාපිෂ්ට

evoking - සර්ව ස්වායත්ත විශ්ලේෂණය (පශ්චාත් නූතනවාදී අර්ථයෙන්)

evolution - පරිණාමය

evolutionism - පරිණාමවාදය

exclusion - බහිෂ්කරණය

exhibitionism - ප්‍රදර්ශන කාමය

exile - විප්‍රවාසය, පිටුවහල් කිරීම

existence - අස්තිත්වය, පැවැත්ම

existentialism - සාන්දෘෂ්ටිකවාදය

exogenous - බහිර්ජන්‍යය

exorcism - භූතාපසරණය, තොවිල්-පවිල් කිරීම

exotic - විචිත්‍ර

experimental practice - පර්යේෂණාත්මක භාවිතය

expository style - අර්ථ ව්‍යාපක ශෛලිය

expressionism - ප්‍රකාශනවාදය

extensions - විස්තීර්ණ

extinction - වඳවීම, නිරෝධය, තුරන්වීම

extremism- අන්තවාදය

extremist - අන්තවාදියා, සීමාස්තිකයා

extrovert - බහිර්වර්තකයා

# F

fabrication - ගෙතීම

facilitation - සුසාධ්‍යකරණය / පහසුකම් සැපයීම

fallacy - ආභාසය, මිථ්‍යා තර්කය

false reading - සදොස් පාඨනය

fanatic - අන්ධ භක්තිකයා

fanaticism - භක්ති උන්මාදය

fantasy - මනස්සෘෂ්ටිය

fashion - විලාසිතා

federal system of government - සන්ධීය ආණ්ඩු ක්‍රමය

femininity - ස්ත්‍රීත්වය

fertility - සාඵල්‍යතාව, දරුඵල

festival - මෙලාව, උළෙල, උත්සවය

fetish - අර්චනකය, පූජා ලාංඡනය

fetishism - අර්චනකවාදය

feudalism - වැඩවසම් ක්‍රමය

fiction - ප්‍රබන්ධය

field of meaning - අර්ථ ක්ෂේත්‍රය

field of signs - සංඥා මණ්ඩලය, සංඥා ක්ෂේත්‍රය

fieldwork- ක්ෂේත්‍ර වැඩ, බිහි වැඩ, ක්ෂේත්‍ර පර්යේෂණ

figuration - රූපීකරණය

figurative - රූපික, සාලංකාර

fine arts - ලලිත කලා

fission - විඛණ්ඩනය

flow of knowledge - බුද්ධි ගලනය

fluctuate - උච්චාවචනය

folk - ජන

force field - බල ක්ෂේත්‍රය

form - ස්වරූපය, ආකෘතිය

formula - සූත්‍රය

formulation - සූත්‍රගත කිරීම, සූත්‍රායනය

fornication - මෛථූනය

foundational categories - පදනම් ප්‍රවර්ග

foundationalism - ප්‍රතිෂ්ඨාවාදය, පදනම්වාදය

fragmentation - ඛණ්ඩනය කිරීම

fragmented - ඛණ්ඩිත

framework - සැකිල්ල

fraternity- සෞභ්‍රාත්‍රය, සහෝදරත්වය

French classicism - ප්‍රංශ සම්භාව්‍යවාදය

frenzy - වියරුව

frequency - සංඛ්‍යාතය, නිරන්තරය

frustration - ඉච්ඡාභංගත්වය

functionalism - කෘත්‍යවාදය

fundamentalism - මූලධර්මවාදය

fusion - සම්පර්කය, විලයනය

# G

galactic polity - මන්දාකිණි ආණ්ඩුක්‍රමය

galaxy - මන්දාකිණිය, ක්ෂීර පථය, චක්‍රාවාටය

galaxy of signifieds - සූචක මණ්ඩලය

gaze - අවලෝකනය, බැල්ම

gender - සමාජ ලිංගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය

gene - ජානය

gene mutation - ජාන විපරිවර්තනය

genealogy - පෙළපත, වංශාවලිය / පෙළපත්වේදය, ප්‍රභවවේදය,

generalization - සාමාන්‍යකරණය, සාධාරණීකරණය

genesis - සම්භවය, ජනනය

genetic - ජානමය

genius - ප්‍රාඥයා, ධීමතා

genocide - ජන ඝාතනය

genre - ප්‍රවර්ගය, ප්‍රභේදය

gentrified - ගෞරවාරෝපිත

gentry - වංශවත්තු

genus - ගණය

geo-chronology - භූ කාලානුක්‍රමවේදය, භූ කාලානුක්‍රමය

geo-political - භූගෝලීය-දේශපාලනික / භූ-දේශපාලනික

German classicism - ජර්මානු සම්භාව්‍යවාදය

German idealism - ජර්මානු පරමාදර්ශවාදය

German romanticism - ජර්මානු රෝමාන්තිකවාදය, ජර්මානු විචිත්‍රාද්භූතවාදය

ghetto - මුඩුක්කුව, ගුබ්බෑයම

giving - දීම

globalization - ගෝලීයකරණය

glorification - මහිමවත් කිරීම

governmentality - ආණ්ඩුකරණත්වය

gradual - ක්‍රමික

graffiti - කුරුටු සටහන්

Gregorian chant - ග්‍රෙගෝරියානු සජ්ඣායනය

grotesque - විකෘතරූපී, අපරූපී

group - කණ්ඩායම්, සමූහය, එකතුව

gymnasium - ජව සරඹහල

# H

habitat - වාසභූමිය

habitus - හැබිටස්, සංදේහිත පෞරුෂය

hagiography - ශාන්තු ලේඛනය

harmony - සුසංවාදය, ප්‍රසංවාදය, සංගතිය

hearsay - ඕපදූප

hegemonic masculinity - පුරුෂත්වයේ අණසක

hegemony - අණසක

hermetic poetry - ගුප්ත කාව්‍ය

hero worship - වීරාභිවන්දනය

heroic analysis - වීර කේන්ද්‍රීය විශ්ලේෂණය

heterodoxy - වෛධාර්මික

heterogeneity - විෂමජාතිත්වය

heterogeneous - විෂමජාතීය

heterosexual - විෂමලිංගික

heterotopic spaces - බහු ප්‍රස්තුත අවකාශ

heuristic - විවරණෝපයෝගී

hierarchy - ධුරාවලිය

high art - උච්ච කලාව, උසස් කලාව

historical author - ඓතිහාසික කර්තෘ

historical center - ඓතිහාසික කේන්ද්‍රය

historical consciousness - ඓතිහාසික සවිඥානකත්වය

historical development - ඓතිහාසික වර්ධනය

historical materialism - ඓතිහාසික භෞතිකවාදය

historical moment - ඓතිහාසික මොහොත

historical sequentiality - ඓතිහාසික අනුක්‍රමිකතාව

historical value - ඓතිහාසික අගය

historically conditioned taste - ඓතිහාසිකව හැඩගැස්වුණු රුචිය

historicism - ඉතිහාසවාදය, ඓතිහාසිකවාදය

historicist - ඓතිහාසිකවාදී, ඉතිහාසවාදී

history of visual arts - දෘශ්‍ය කලා ඉතිහාසය

holy sacrament - ක්‍රිස්තියානි සත්ප්‍රසාදය

home sickness - නිජබිම් කාංසාව

homogeneous - සමජාතිය

homology - සමප්‍රභවය

homosexuality (gay) - සමලිංගිකත්වය

horizon - ක්ෂිතිජය

hostility - එදිරිවාදීත්වය

humanism - මානවවාදය

hybrid - සංකර, දෙමුහුන්, තුප්පහි

hymns - ගීතිකා

hyper density (population) - අධි ජනඝනත්වය

hyper dependency - අධිපරාධීනත්වය

hyper legible - අධිපැහැදිලි

hyper reality (hyper-real) - අධියථාර්ථය (අධි-තථ්‍ය)

hyper space - අධි අවකාශය

hyper-placelessness - අති-අස්ථානියත්වය

hypothesis - උපන්‍යාසය

hysteria - මායා රෝගය, හිස්ටීරියාව

# I

icon, image - ප්‍රතිරූපය

iconoclasm - ප්‍රතිමා භංගය, ප්‍රතිමා බිඳ හෙළීම

iconography - ප්‍රතිමා විද්‍යාව, රූපාර්ථවේදය

ideal - පරමාදර්ශය, පුරුෂාර්ථය

idealism - විඥානවාදය, පරමාදර්ශවාදය

identical - සර්වසම

identity formation - අනන්‍යතා සැකැස්ම

ideology - මතවාදය, දෘෂ්ටිවාදය

ideology of victimhood - හානිපත්භාවයේ මතවාදය

idiom - ව්‍යවහාර සම්ප්‍රදාය

idiosyncratic - ස්වචාරී

idolatry - රූප වන්දනය

illegitimate - අවජාතක

illicit - අගම්‍ය, අයථා

illumination - ආදීපනය

illusion - මායාව

illustration - සන්නිදර්ශනය, නිදර්ශනය, උදාහරණය

image - ප්‍රතිරූපය

imagination - පරිකල්පනය

imagined community - පරිකල්පිත ප්‍රජාව

imbecile - මූර්ඛයා

imitation - අනුකරණය

immediate consumption - ක්ෂණික පරිභෝජනය

immediately - අනන්තරව, වහා, සැණෙකින්

impersonation - සමාරෝපණය, අන්වේක්ෂණය

impetus - ගාමක බලය, ප්‍රගාමකය

implication - ගම්‍යමානය

implosion - අර්ථ විනාශය (පශ්චාත් නූතනවාදී අර්ථයෙන්)

impression - ධාරණාව

impressionism - ධාරණාවාදය / උපස්නපීවාදය

imprimatur of truth - සත්‍යයේ අධිකාරිය

improvisation - හිටිවන නිර්මාණය

inactive - අක්‍රිය

inborn - සහජ

incest - ව්‍යභිචාරය

indeterminacy - අවිනිශ්චිතත්වය, අනියතතාව

indeterminacy of reference - සමුද්දේශීය අනියත බව

indeterminate reference - අනියත සඳහන, අනියත සමුද්දේශය

index - දර්ශකය

indifference - අනුත්සුක බව, උපේක්ෂාව, උදාසීනත්වය

indigenous (local) codes - දේශීය කේත, පරිස්ථානීය කේත

individualism - ඒකපුද්ගලවාදය

individuality - ඒකපුද්ගලත්වය

inductive - උද්ගාමී

inference - අනුමානය

inflation - උද්ධමනය

informant - ඥාපකයා, තොරතුරු දායකයා, දත්ත දායකයා

information systems - තොරතුරු පද්ධති

innovation - නවෝත්පාදනය

insight - අන්තර් දෘෂ්ටිය

instability - අස්ථායිභාවය, අස්ථාවරත්වය

installation - ස්ථාපනය

integration - අනුකලනය

integrity - සාකල්‍ය බව

intellectual - බුද්ධිමතා, බුද්ධිජීවියා

intellectual structure - මනෝ ව්‍යුහය, බුද්ධි ව්‍යුහය

intellectual thrust - බුද්ධිමය නැඹුරුව

intellectual traditions - ඥාන සම්ප්‍රදා, බුද්ධි සම්ප්‍රදා

intellectualism - බුද්ධිවාදය

intensification - උත්සන්න කිරීම

interaction - අන්තර්ක්‍රියාව

inter-borrowing - අන්‍යෝන්‍ය උපුටාගැනීම

intercourse - සංසර්ගය, මෛථුනය

interest - රුචිකත්වය, රුචිය, අභිරුචිය / පොළිය

interface - අතුරු මුහුණත

internal contradiction - අභ්‍යන්තර ප්‍රතිවිරෝධය

internally displaced people (IDP) - අභ්‍යන්තරිකව අවතැන්වූවෝ

interpolate - අන්තර් නිවේශනය

interpretation - අර්ථකථනය, අර්ථවිවරණය

interpretational structure - අර්ථවිවරණාත්මක ව්‍යුහය

inter-textual - පාඨාන්තරීය, අන්තර් පඨිත

inter-textuality - පාඨාන්තරීයත්වය, අන්තර් පඨිතත්වය

introductory text - ප්‍රවේශාත්මක පඨිතය

introspection - අන්තරාවලෝකනය

introvert - අන්තරාවර්තිකයා

intuition - ප්‍රතිභානය, අන්තර්ඥානය

invent - නවෝත්පාදනය, නිපදවීම, උත්පාදනය

inverse - ප්‍රතිලෝමනය

inversion - ප්‍රතිලෝමය

involuntary - අනිච්ඡානුගත

irony - ව්‍යාජෝක්තිය

isomorphic - සමරූපී

iterant artist - තැනින් තැනට ඇවිදයන කලාකරු

# J

judgment of taste - රුචිය පිළිබඳ විනිශ්චය

juncture - සන්ධිය, අවස්ථාව, තීරණාත්මක මොහොත, කාලසන්ධිය

jurisdiction - අධිකරණ බලය

justice - යුක්තිය

justification, legitimization - යුක්ති යුක්තකරණය, සාධාරණීකරණය

juxtaposition - සංනිධාපනය

## K

kitsch - සරුව පිත්තල

knowledge - දැනුම, ඥානය

## L

labyrinth - වංකගිරිය, අවුල් මග

laissez-faire system - රාජ්‍ය නිර්බාධ ක්‍රමය, නිර්බාධ ක්‍රමය

landmarks - ප්‍රමුඛස්ථාන

languorous - ඔතෑනි

latent - අනුශය, නිලීන

le quotidien - දෛනිකත්ව ජීව දෘෂ්ටිය (පශ්චාත් නූතනවාදී අර්ථයෙන්)

legends - පුරාවෘත්ත

legitimation - යුක්ති යුක්තකරණය

legitimize - සුජාතකරණය

lesbianism - ස්ත්‍රී සමලිංගිකත්වය

liberal utilitarians - ලිබරල්වාදී උපයෝගිතාවාදීහු

liberalism - ලිබරල්වාදය

liminal - උපාන්තික

linear perspective - ඒකරේඛීය පර්යාවලෝකනය

lingua franca - සාර්ව භාෂාව

linguistic systems - වාග් විද්‍යාත්මක පද්ධති

literary genre - සාහිත්‍ය ප්‍රවර්ගය

little tradition - චූල සම්ප්‍රදාය

lived experience - ජීවන අනුභූතිය

local - පරිස්ථානීය

locality - පරිස්ථානය

logocentric- වාග් කේන්ද්‍රීයත්වය, බහිර් සමුද්දේශ කේන්ද්‍රීයත්වය

love-hate relationship - ආදර-අනාදර සම්බන්ධතාව

low art - පහත් කලාව

lumpen - අසංවිධිත සමාජ ස්තරය

# M

macro - මහා, සාර්ව

madness - උන්මාදය, උමතුව, පිස්සුව

magic realism - ආශ්චර්යාත්මක යථාර්ථවාදය, මායා යථාර්ථවාදය

mainstream - ප්‍රධාන ධාරාව, මුඛ්‍ය ධාරාව

making (made) the gentleman - මහාත්මා නිමාව

male chauvinism - පුරුෂෝත්තමවාදය

malevolence - අනර්ථකාමය, අහිතකාමය

man-eating - මනුෂ්‍ය භක්ෂක

manipulation - සංචාලනය

manliness - පිරිමිකම

marginal - ආන්තික

marginal identity - ආන්තික අනන්‍යතාව

marginalization - ආන්තිකකරණය

martial arts - රණ කලා, සටන් කලා

masculinity - පුරුෂත්වය

masochism - ස්වපීඩා කාමය

masquerade - ව්‍යාජ නියෝජනය

mass psychology - ජන මනෝවිද්‍යාව

master discourse - ප්‍රධාන (මහා) කතිකාව

masterpiece - අග්‍රකෘතිය, මහා නිර්මාණය

matricide - මාතෘ ඝාතක / මාතෘ ඝාතනය

matrix - මාතෘකය, න්‍යාසය

meaning - අර්ථය

mechanical art - යාන්ත්‍රික කලාව

mediation - මැදිහත්වීම, මැදිහත්කරණය

mediocrity - බුද්ධි හීනත්වය

megalomania - වෘහශෝන්මාදය

melancholia - විෂාදතාව, උකටලීත්වය

mélange - මුසුව / සරණිය

melody - ස්වර මාධුර්යය

memory - ස්මෘතිය, මතකය

messianic - ගැළවුම්කාර

meta-history - පාර-ඉතිහාසය

metamorphosis - රූපාන්තරණය

metaphor - රූපකය

metaphysics - පාරභෞතිකවාදය

methodology - ක්‍රමවේදය

micro - ශුද්‍ර

mien - ඇවැතුම්

milieu - පරිසරය

militancy - සටන්කාමීත්වය

militarism - රණ පරමවාදය, සංග්‍රාමවාදය

militarization - සංග්‍රාමකරණය

miming - අභිරූපණය

minor deities - සුළු දෙවිවරු, අල්පේශාක්‍ය දෙවිවරු

minority - සුළු ජනප්‍රජාව

mirror - පිළිබිඹු කිරීම, ප්‍රතිබිම්බනය / කැඩපත

miscegenation - ජාති සංකරණය, ජාති මිශ්‍රණය, දෑ මුසුව

mixed - සම්මිශ්‍රිත

mockery - පරිහාසය

modernism - නූතනවාදය

modernity - නූතනත්වය

molecule - අණුව, මෞලය

moment - මොහොත

mono-cultural - ඒකසංස්කෘතික

mono-ethnic - ඒකජනවාර්ගික

monolith - ඒකශිලා

monotheism - ඒකදේවවාදය

monumental - ස්මාරකීය

monuments of protest - ප්‍රතිරෝධයේ ස්මාරක

moral - සදාචාරය

moralist - සදාචාරවාදියා

motivation - අභිප්‍රේරණය

move - පියවර

moving images - චලන රූප

multi cultural - බහුසංස්කෘතික

multi culturalism - බහුසංස්කෘතිකවාදය

multi-faceted - බහ්වාංගික

multiple meanings - බහු අර්ථ

multiple readings - බහු කියවීම්, බහු පාඨන

multiplicity - බාහුල්‍යය

murals - බිතු සිතුවම්

mutant - විපරීත රුව / විපර්යාසයෙන් ජනිත

mutate - විපර්යාසිත

mutual - අන්‍යොන්‍ය

mutually antagonistic - අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධතාව

mysticism - ගුඪවාදය

mystification - ගුඪකරණය

myth - මිථ්‍යාව, පුරාණෝක්තිය

myth making - මිථ්‍යා නිපැයීම, මිථ්‍යාකරණය

myth models - මිථ්‍යා විශ්වාස ආකෘති

mythological - පුරාණෝක්තිමය, පුරාණෝක්තික

mythology - පුරාණෝක්තිවාදය

# N

naïve - අවිදග්ධ, ලාමක

naive assumption - ලාමක උපකල්පනය

narcissism - ස්වරූප රාගය

narratalogy - ආඛ්‍යානවේදය

narrative - අඛ්‍යානය

narrative theory - ආඛ්‍යාන න්‍යාය

national - ජාතික

national identity - ජාතික අනන්‍යතාව

nationalism - ජාතිකවාදය

nationality - ජාතිකත්වය

nations - ජාති

natural beauty - ස්වාභාවික සුන්දරත්වය

naturalness - ස්වාභාවික බව

necrophagia - ශවභක්ෂණය

negotiation - සාකච්ඡාව, ප්‍රමන්ත්‍රණය, සංසන්ධි කතිකාව

negotiator - සංසන්ධිකයා

nepotism - ඥාතිවාදය, ඥාති සංග්‍රහය

new ethnicities - නව ජනවර්ග

new ethnography - නව මානවවංශකරණය

Newtonian science - නිව්ටෝනියානු විද්‍යාව

nihilism - ශූන්‍යවාදය, නාස්තිකවාදය

nihilist - ශූන්‍යවාදියා

noble houses - රදළ නිවෙස්

noble savages - වංශවත් (කුලීන) ම්ලේච්ඡයෝ

nodal point - නිෂ්පන්ද ලක්ෂය

nominal - නාම මාත්‍රික

non historical - න-ඓතිහාසික

non-conformist - අනුකූල විරෝධියා

nondescript - න-විස්තර (විස්තර කළ නොහැකි)

nonobjective art - න-වාස්තවික කලාව

nonobjective painting - න-වාස්තවික චිත්‍රය, වාස්තවික නොවන චිත්‍රය

norm - ප්‍රතිමානය

nostalgia - අතීත රංජනය / සාංකාව

notion - මතිය

nymphomania - නාරිකාමෝන්මාදය

# O

objective - විෂය නිශ්‍රිත, වාස්තවික / අරමුණ

obsession - ග්‍රස්තිය

obsessive rhythms - ග්‍රස්තික රිද්ම

Occident - ප්‍රතිචීනය

occidental - ප්‍රතිචීන

occidentalism - ප්‍රතිචීනවාදය

occult science - තිරශ්චීන විද්‍යා

Oedipus complex - ඊඩිපස් සංකීර්ණය

offering - දක්ෂිණාව / පිදවිල්ල

oneness - ඒකත්වය

ontology - සත්භාවය

opinion survey - මත සමීක්ෂණය, ජනමත විචාරණය

oppositional politics - විරුද්ධවාදී දේශපාලනය

optical illusion - දෘෂ්ටි මායාව

oration - ප්‍රසිද්ධ දේශනය

oratory - කථිකත්වය

ordering - පර්යායගත කිරීම

organic - ඓන්ද්‍රිය

organic structure - ඓන්ද්‍රිය ව්‍යූහය

organic unity - ඓන්ද්‍රිය ඒකාග්‍රතාව

organicity - ඓන්ද්‍රියත්වය

organism - ජීවියා

orientalism - ප්‍රාචීනවාදය

orientation - දිශානතිය

origin - ප්‍රභවය

origin of modernity - නූතනවාදයේ ප්‍රභවය

original - අපූර්ව

original creation - අපූර්ව නිර්මාණය

original image - මුල් ප්‍රතිරූපය

orthodox - සාධාර්මික

oscillation - දෝලනය

othering - අනෙකා ගොඩනැගීම

otherness - අනෙක්බව

over assess - අතිතක්සේරුව

over expose - අධිඅනාවරණය

over sexuality - අධිලිංගිකත්වය

overall spatial ensemble - අවකාශීය සමස්තය

over-determine - අධිනිශ්චය

overlap - අතිච්ඡාදනය

oxymoron - විරෝධෝක්තිය

# P

pacifist - ශාන්තිවාදය

painterly mode of looking - චිත්‍ර ශිල්පීය දෘෂ්ටිය

paleography - පුරාක්ෂර විද්‍යාව

pantheon - දේව මණ්ඩලය

pantomime - රංගනාදර්ශය

para military units - පාර-හමුදා කල්ලි. පාර-හමුදා ඒකක

para-cultural - පාර-සංස්කෘතික

paradigm - සුසමාදර්ශය

paradox - විරුද්ධාභාසය

paradoxical - විරුද්ධාභාසීය

paralogism - තර්කාභාසය

parameter- පරාමිතිය

para-site - පාර-බිම්කඩ

parricide - මාතෘ හෝ පිතෘ ඝාතක / සමීප ඥාති ඝාතක

participant - සහභාගිවන්නා

pastiche - ප්‍රකීර්ණකය

paternalistic - පිතෘවාදී

paternity - පිතෘත්වය

path of meaning - අර්ථ පථය

pathological conditions - මනෝ ව්‍යාධි තත්ත්ව

patricide - පිතෘ ඝාතක

patrilateral - පිතෘ පාර්ශ්වීය

patrilineal - පිතෘ මූලික, පිය පේරුව

pattern - රටාව

patterned - රටාගත

perceived - සංජානිත

perceived right - සංජානිත අයිතිය

perception - සංජානනය

performance arts - අභිවාහ්‍ය කලා, නිරූපණ කලා

performative - අභිවාහ්‍ය

performative overtone - අභිවාහ්‍ය වැදගත්කම

performativity - අර්ථ සම්පාදකතාව (පශ්චාත් නූතනවාදී අර්ථයෙන්)

performing arts - ප්‍රසාංගික කලා

perimeter - පරිධිය / පරිමිතිය

peripatetic - පරිපඨන

periphery - පරිවාරය

permanent meanings - ස්ථිර අර්ථ

personal decorum - පෞද්ගලික (පුද්ගලික) සුසංවරය

perspectival space - පර්යාවලෝකීය අවකාශය

perspective - පර්යාවලෝකය

pessimism - අශුභවාදය

petit bourgeoisie - සුළු ධනේශ්වරය

phallic - ශෛශ්නරූප

phallo-centric - ශෛශ්නරූප කේන්ද්‍රීය

phenomenal - ප්‍රපංචවාදී

phenomenology - ප්‍රපංචවේදය, සංසිද්ධි විද්‍යාව

phenomenon - ප්‍රපංචය, සිද්ධිය, සංසිද්ධිය

phenotype - මතුපිට ස්වභාවය

philanthrophy - පරාර්ථ චර්යාව

philology - ශබ්ද විද්‍යාව

philosophical aesthetics - දාර්ශනික සෞන්දර්යවේදය

phonetics - ශබ්ද ශික්ෂාව

phonocentric - භාෂණ කේන්ද්‍රීය

photogenic - ඡායාකාන්ත

physical ineptitude - කායික අදක්ෂභාවය

physical power - කායික ශක්තිය

physiognomy - දේහ ලක්ෂණ විද්‍යාව / මුහුණුවර ලක්ෂණ / හුලක්ෂණ

pictorial - චිත්‍රාත්මක, චිත්‍රමය

pictorial imagery - චිත්‍රමය සංකල්ප රූප

pioneer - පුරෝගාමී

placeless - අස්ථානීය

plagiarism - රචනා චෞරත්වය

play - කෙළිය, සෙල්ලම, රංගය, ලීලාව

playfulness - කෙළිලොල් බව

pleasure - සුඛය, සොමනස

plebeian - පොදු ජනයා

plural text - බහු පඨිත

pluralism - බහුත්වවාදය

poetics - කාව්‍ය ශාස්ත්‍රය

polarization - ධ්‍රැවායණය

polity - සංවිධිත සමාජය

polyandry - බහු පුරුෂත්වය, බහු පුරුෂ සේවනය

polygamous - බහු විවාහ, බහු වෛවාහික

polygamy - බහු වාසය

polyglot - බහු භාෂික

polygyny - බහු භාර්යා සේවනය, බහු භාර්යාත්වය

polyphonic - බහු ස්වනීය, බහු ශාබ්දික

polyphonic tradition - බහුශාබ්දික සම්ප්‍රදාය

polyphony - බහු ස්වනය

popular consumption - ප්‍රසිද්ධ පරිභෝජනය, ජනප්‍රිය පරිභෝජනය

popular discourse - ජනප්‍රිය කතිකාව

population density - ජනඝනත්වය

populist - ජනප්‍රියවාදී, ජනතාවාදී

posit - උපග්‍රහණය

position - ස්ථාවරය, ආස්ථානය

positive - ධනාත්මක, ප්‍රතිජානන, ධන, සාධනිය

possibilities - භව්‍යතා

post colonial - පශ්චාත් යටත් විජිත

post colonialism - පශ්චාත් යටත්විජිත වාදය, පශ්චාත් විජිතවාදය

post coloniality - පශ්චාත් යටත්විජිතත්වය

post colony - පශ්චාත් යටත්විජිතය

post Darwinian - පශ්චාත් ඩාවිනියානු

post enlightenment - පශ්චාත් පුනරුද

post modern - පශ්චාත් නූතන

post modernism - පශ්චාත් නූතනවාදය

postcolonial studies - පශ්චාත්-යටත්විජිතවාදී අධ්‍යයන

post-structuralism - පශ්චාත්-ව්‍යුහවාදය

post traumatic stress disorder (PTSD) - පශ්චාත් ව්‍යසන ක්ලමථ අක්‍රමතාව

potential - විභවය

practices - භාවිත

pragmatic - ප්‍රයෝජ්‍යතාවාදී, උපයෝග්‍යතානුරූපී

pragmaticism - ප්‍රයෝජ්‍යවාදය

praxis - ප්‍රයුක්තිය, පිළිගත් සිරිත, පිළිගත් භාවිතය

precedence - පූර්වාදර්ශය

precidented (precedence) - පූර්වාදර්ශිත

prehistory - ප්‍රාග් ඉතිහාසය

prejudice - පූර්ව විනිශ්චය, අගතිය

prejudicial - අගතිගාමී

preoccupation - පූර්වාවධානය

prerogative - පරමාධිකාරය

prevention - නිවාරණය

primary narratives / stories - ප්‍රාථමික ආඛ්‍යාන / වෘත්තාන්ත

primitive - ප්‍රාථමික, ආදිල්පික

primitive societies - ප්‍රාථමික සමාජ

principalities - කලාපීය රාජ්‍ය

privilege - වරප්‍රසාදය

privileged - වරප්‍රසාදිත

problematic - ගැටලු විශ්වය, සංවාද ගැටලුව

product of genius - බුද්ධි ශ්‍රේෂ්ඨයෙකුගේ නිර්මාණය

productive ambiguities - සාඵල්‍යය සන්දිග්ධතා

project - ව්‍යාපෘතිය

projection - ප්‍රක්ෂේපණය

proletarian shopping - නිර්ධන පාන්තික වෙළෙඳ සවාරි

proletariat - නිර්ධන පන්තිය

promiscuous - සව්‍ය සංවාස

propaganda - ප්‍රචාරක, ප්‍රචාරණය

property speculation - දේපොළ සමපේක්ෂණය

prophecy - භාවිකථනය, අනාවැකිය

proselytization - ලබ්ධි ග්‍රහණය

protected space - ආරක්ෂිත අවකාශය

proto-nationalism - මූලාදර්ශ-ජාතිකවාදය

pseudo - ව්‍යාජ

psychological criticism - මනෝවිද්‍යාත්මක විචාරය

puberty - මල්වරය, කොටහළුව

public domains (spaces) - පොදු අවකාශ

public education - පොදු අධ්‍යාපනය

public sphere - පොදු අවකාශය

puritanical - පාරිශුද්ධ

puritanism - උග්‍රාචාරවාදය, පාරිශුද්ධවාදය

putative identity - විද්‍යමාන අනන්‍යතාව

# Q

qualify - යෝග්‍යකරණය

quartering - අත් පා සිඳලීම

quotation - උපුටනය, උද්ධෘතය, උපුටා ගැනීම

quotidian - දෛනික, සාමාන්‍ය, සරල

# R

race - වර්ගය

racial - වාර්ගික

radiation - විකිරණය

radical - පටිසෝතගාමී

radical and elitist - පටිසෝතගාමී හා ප්‍රභුවාදී

radicalization - පටිසෝතකරණය, උන්මූලකරණය

rank - තාරාතිරම

rational order - සබුද්ධික පර්යාය

rationalism - හේතුඵලවාදය

rationalist - හේතු ධර්මවාදියා

rationalization - තර්කාපනය

reader - පාඨකයා

reader response theory - පාඨක ප්‍රතිචාර න්‍යාය

readerly, readable - කියැවිය හැකි

readerly surface - පාඨීය මතුපිට

readerly text - පාඨීය පඨිතය

reading - පාඨනය, කියැවීම

real - තථ්‍ය

real power - තථ්‍ය බලය

realism as attitude - යථාවාදී බව ආකල්පයක් ලෙස

reality - යථාර්ථය, සත්තාව

re-categorization - ප්‍රති-ප්‍රවර්ගීකරණය

receptiveness - ප්‍රතිග්‍රාහීභාවය

receptivity - ග්‍රාහකතාව

recognition - හඳුනාගැනීම

reconciliation - සමාධානය, පුනස්සමථය, සංහිඳියාව, සාමදානය

re-constitution - ප්‍රති-සංස්ථාපනය, ප්‍රති-සකස්කිරීම, ප්‍රති-සැකසීම

recurrence - පුනරාවර්තනය

reduction - ඌනනය

reference features - සමුද්දේශ ලක්ෂණ

reflect - ප්‍රත්‍යවේක්ෂණය

reflected image - පිළිබිඹු වූ ප්‍රතිරූපය

reflection - ප්‍රත්‍යවේක්ෂය, පිළිබිඹුව, ප්‍රත්‍යවලෝකනය, පරාවර්තනය

reflexive - ප්‍රත්‍යවර්තික, ප්‍රත්‍යවලෝකනීය

reformation - සංශෝධනය, ප්‍රතිසංස්කරණය, ප්‍රතිශෝධනය

regime - බලමණ්ඩලය, (පාලන) තන්ත්‍රය

regime of governmentality - ආණ්ඩුකරණ තන්ත්‍රය

regulate - යාමනය, නියාමනය

rehabilitation - පුනරුත්ථාපනය

reification - යථාභූතීකරණය

reinforce - ප්‍රතිසාධනය

rejoice - ප්‍රමෝදය, ප්‍රමුදිත වීම

relativism - සාපේක්ෂතාවාදය

relativity - සාපේක්ෂතාව

religious metaphors - ආගමික රූපක

renaissance - පුනරුදය

repatriate - දේශප්‍රත්‍යාවර්තනය

repetition - පුනරාවර්තනය, නැවත නැවත සිදුවීම

replace - ආදේශ කිරීම, ආදේශනය

representation (re-presentation) - නියෝජනය, පෙනී සිටීම, නිරූපණය

requiem - අනුස්මරණ වාක්‍යය

re-read - ප්‍රති-පාඨනය, නැවත කියවීම

residential - වාසික

resilience - ප්‍රත්‍යස්ථිතිකත්වය

resilient - ප්‍රත්‍යස්ථිතික

resistance - ප්‍රතිරෝධය, විරෝධය

resonate - අනුනාදය / අනුනාදවීම

restablization - ප්‍රතිස්ථායීකරණය

restriction of movement - සංචලන සීමා

resurrection - උත්ථානය

retinal - විතංස

retrospect - ප්‍රත්‍යාක්‍ෂණය

return - පුනරාගමනය

reverberate - ප්‍රතිරාවය

revisionism - ප්‍රතිශෝධනවාදය

revival - පුනර්ජීවනය

rhetoric - ආලංකාරිකය, අලංකාරෝක්තිය, අතිශයෝක්ත්‍යාලංකාරය

rhythm - රිද්මය

riot - කෝලාහලය

ritualistic enjoyment of art - කලාව යාතුකර්මීය ආකාරයෙන් විඳීම

romantics - විචිත්‍රාද්භූතවාදීහු, රොමාන්තිකවාදීහු

romanticism - විචිත්‍රාද්භූතවාදය, රොමාන්තිකවාදය

root metaphor - මූල රූපය

routine - ආකාරිකය

routinization - ආකාරිකයනය

rupture - ඛණ්ඩනය

ruralization - ග්‍රාමීයකරණය

# S

sacrament - සත්කර්මය, සක්‍රමේන්තුව

sacrilege - කෙලෙසීම

saga - වීරාඛ්‍යානය

sanctioned - සම්මුති බද්ධ, සම්මුතිගත

sanskritization - සංස්කෘතකරණය

savage - ම්ලේච්ඡ, වනචාරී

scandal - ගර්හාව, අපචාරය

scenic realism - දර්ශනීය යථාර්ථවාදය

school mindedness - පාසල් මානසිකත්වය

scientific method - විද්‍යාත්මක ක්‍රමය

scientific progress - විද්‍යාත්මක ප්‍රගතිය

scientization - විද්‍යාකරණය

scopic regimes - දෘශ්‍ය තන්ත්‍ර

scrutinizing - සියුම්ව පරීක්ෂාකර බැලීම, සුපරීක්ෂාව

secular - ඓහික, ලෞකික

segregation - විසංගමනය

self - ආත්මය, අස්මිතාව

self-abasement - ස්වයං-අවමානය

self centered - ස්වාත්ම කේන්ද්‍රිය

self-contained - ආත්ම පරිගෘහිත

self-contradiction - ස්ව-විසංවාදය

self-criticism - ස්වාත්ම විවේචනය

self-deception - ස්වාත්ම වංචනය

self-determination - ස්වයං-නිර්ණය

self-elevation - අත්නුක්කංසාවාදය

self respect - ස්වයං අභිමානය

self-assertion - ස්ව-බලය තහවුරු කිරීම

self-conscious reflection - ස්ව-සවිඥානක අවලෝකනය

self-effacement - ස්වයං-අප්‍රසිද්ධිය

self-evident - ස්වයං-ප්‍රත්‍යක්ෂ

self-explorations - ස්වයං-ගවේෂණ

self-fulfillment - ආත්ම සන්තෘප්තිය

self-perception - ස්වයං-සංජානනය

self-projection - ස්වාත්ම ප්‍රක්ෂේපණය

self-realization - ස්වාත්ම සාධනය

self-reliance - ස්ව-ශක්තික ආත්මාවලම්බනය

self-representation - ස්වයං-නියෝජනය

self-understanding - ස්වයං-අවබෝධතාව

semantics - අර්ථ විභාගය, අර්ථ විචාරය

semiotic approach - සංඥාර්ථවේදී එළඹුම

semiotician - සංඥාර්ථ විචාරකයා, සංඥාර්ථවේදියා

semiotics - සංඥාර්ථවේදය

sensitivity - සංවේදිතාව

sensuous desire - ඉන්ද්‍රිය බද්ධ ආශාව

sentiment - මනෝභාවය

seriality - අනුක්‍රමිකතාව

sermon - ධර්මානුශාසනාව

set of methodological assumptions - ක්‍රමවේදී අභ්‍යුපගමන කුලකය

settled - නිශ්චල, පදිංචි

settlement - ජනාවාසය / ජනාවාසකරණය

sexual minority - ලිංගික සුළුතරය

sexual power - ලිංගික ශක්තිය

sexuality - ලිංගිකත්වය

shift - විස්ථාපනය

shipwreck - නෞකා භංගය

sign - සංඥාව

sign language - ඉඟිබස

signification - සූචනය

signified - සූචිතය

signifier - සූචකය

signify - සංඥාකෘතකරණය

similarity - සමතාව

similitude - සාදෘශ්‍යය, සාම්‍යබව

simulacrum - අනුකෘතිය

simulated - ව්‍යාපිදේශිත

single-motherhood - ඒකමාතෘත්වය

singular - ඒකභාවී

skeptic - සංශයවාදියා

skeptical - සංශයවාදී, සැක මුසු

skepticism - සංශයවාදය

skill - නිපුණතාව

skyline - ගුවන් ඉම

smuggled - අවහරණය

social capital - සමාජ ප්‍රාග්ධනය

social practices - සමාජ ව්‍යවහාර, සමාජ භාවිත

social reform - සමාජ ශෝධනය, සමාජ සංශෝධනය

social-demography - සමාජ ප්‍රජාවිද්‍යාව

socialization - සමාජානුයෝජනය

soteriology - විමුක්ති සාධනවේදය

space - අවකාශය

spaces of attraction - ආකර්ෂණ අවකාශ

spatial identity - අවකාශීය අනන්‍යතාව

species - විශේෂය

spectacle - ප්‍රේක්ෂාව

speculation - සම්පේක්ෂණය, අනුමානය

speculative idealism - මානසවිචාරී පරමාදර්ශවාදය

speech - භාෂණය

spirit - ජීවගුණය / භූතාත්මය

spirit intervention - භූත බලපෑම

spontaneous - නිරායාස, ස්වයං සිද්ධ

sprit of giving - දාන චිත්තය

spritely (sprightly) - කඩිසර, උද්‍යෝගිමත්

standardization - ප්‍රමිතකරණය

statement - ප්‍රකාශය / උක්තිය

static - ස්ථිතික

stereotype - ඒකාකෘතිය

strategic formation - උපාය මාර්ගික සැකැස්ම

strategic location - උපාය මාර්ගික ස්ථානය

stress - ප්‍රත්‍යාබලය, ක්ලමථය

structure - ව්‍යුහය

structure of feeling - සංවේද ව්‍යුහය, සංවේද රටාව

style - ශෛලිය

subaltern - නිර්-ප්‍රභූ, පරිපීඩිත, උපාශ්‍රිත

subaltern studies - නිර්-ප්‍රභූ අධ්‍යයන

sub-culture - උප සංස්කෘතිය

sub-discipline - අනුශික්ෂණය, උප විෂය

subject - මාතෘකාව / වස්තු විෂය / යටත් වැසියා

subject matter - විෂය කරුණ

subjective - පුද්ගල නිශ්‍රිත, අවස්ථායි / අස්ථාවර

subjectivities - අස්මියත්ව

subjectivity - අස්මියත්වය / ආත්මීයත්වය

subjugation - යටත් කරගැනිම

subsititution - ආදේශනය

subsume - අන්තර්ගත

sub-text - අනුපඨිතය

suburb - නගරෝපාන්තය

sufficient reason - පර්යාප්ත හේතුව

suicide bomber - ස්වයං ඝාතක බෝම්බකරු

super ego - අධි අහම

supersructure - උපරි ව්‍යුහය

supposition - අභ්‍යුපගමය

surreal(ism) - අධිතාත්වික(වාදය), අධියථාර්ථ(වාදය)

surveillance - අවේක්ෂණය

survival - අතිජීවනය

survival of the fittest - උචිතෝන්තිය, යෝග්‍යතම ස්ථිතිය

survivor - අතිජීවියා

symbol - සංකේතය

symbolic landscape - සංකේතීය භූමි දර්ශනය

symbolic order - සංකේතීය පිළිවෙළ

symbolic power - සංකේතීය බලය

syncretism - සංකලනය (සාමාන්‍ය අර්ථය)

syncretism - මත/භාවිත සංකලනය (පශ්චාත් නූතනවාදී අර්ථයෙන්)

syndrome - සහලක්ෂණය, සංධාවය

synergy - සංශක්තිය

syntax - වාක්‍ය වින්‍යාසය, වාක්‍ය විචාරය, පද සටනය

synthesis - සංකලනය

system - පද්ධතිය

systematic - ක්‍රමික

# T

Tamil - දමිළ, දෙමළ

tarry - මිඩංගු වෙනවා

taste - රුචිය, රුචිකත්වය

tautology - පුනරුක්තිය, පුනර්වාචනය

technique - ශිල්පය

technology - තාක්ෂණය

technology of government - ආන්ඩුකරණයේ තාක්ෂණය

temporal structure - කාලික ව්‍යුහය

temporality - කාලිකත්වය

temptation - ප්‍රලෝභනය, පෙලඹුම

tension - ආතතිය

terror - ත්‍රස්තය

text - පඨිතය

textual intention - පඨිතාගත අභිප්‍රාය

the beautiful - සුන්දර දේ

the divine - දිව්‍යමය දේ

the other - අනෙකා

the symbolic - සංකේතීය දේ

theatrical performance - නාටකීයව රඟදැක්වීම, නාට්‍යමය රඟදැක්වීම

theism - දේවවාදය

theme parks - තේමා උද්‍යාන, තේමා උයන්

theodicy - දේව යුක්තිවාදය

theorem - ප්‍රමේයය

theologian - දේවධර්මවාදියා

theology - දේවධර්මය, දේවධර්මවාදය

theoretical implication - න්‍යායාත්මක අනුමිතිය

theoretical perspectives - න්‍යායික පර්යාවලෝකනය

theosophy - පරම විඥානාර්ථවාදය

thesis - ප්‍රවාදය

time images - කාල මනෝරූප

timeless - කාල මුක්ත

totalizing - සර්වාධිකාරී

totem - ගෝත්‍ර චිහ්නය, ගෝත්‍ර ලාංඡනය

tradition - සම්ප්‍රදාය

tragedy - ශෝකාන්තය, ඛේදාන්තය

trait - ගති ලක්ෂණය

transcend - අතිරෝහණය, උත්තීරණය, අතික්‍රමණය

transcendence of god - දෙවියන් වහන්සේගේ අනුභූති උත්තරභාවය

transcendent - අතිරෝහණකය

transcript - අත්පිටපත

transformation - විපරිවර්තනය, පරිණාමනය, රූපාන්තරණය

transgression - අතික්‍රමණය

trans-historical - පාර-ඓතිහාසික

transient - අනිත්‍ය

transitory arts - සංක්‍රාන්ති කලා

translate - පරිවර්තනය

transmission - සම්ප්‍රේෂණය

transparency - පාර දෘශ්‍යතාව, විනිවිද පෙනෙන බව

transpose - අතිස්ථාපනය

trauma - ක්ෂතිය

trend - ප්‍රවණතාව

trinity - ත්‍රිත්වය

trophy - මතක වස්තුව

truth, power, liberation - සත්‍ය, බලය, විමුක්තිය

turn - ආවර්තනය

turning point - පරිවර්තක අවස්ථාව

typology - දර්ශවේදය, ප්‍රවර්ගවේදය

# U

unbound seriality - නොබැඳි අනුක්‍රමිකත්වය

unconventional - සම්මතාපසාරී, අචිචාරවත්

undividable unity - අභේද්‍ය සමස්තිය

unique - අතුල්‍ය

unitary - ඒකීය

